කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021
2024 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

# පාලි

(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)

**රචනය, අනියමිත පාඨ හා පාලි සාහිත්‍ය ඉතිහාසය - PALI E2025**

**1, 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සිංහලට නගන්න.

භූතපුබ්බං, භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය, භික්ඛවෙ, ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො 'සොරතා වෙදෙහිකා ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානී'ති. වෙදෙහිකාය ඛො පන, භික්ඛවෙ, ගහපතානියා කාළී නාම දාසී අහොසි දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. 'අථ ඛො, භික්ඛවෙ, කාළියා දාසියා එතදහොසි - 'මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො - 'සොරතා වෙදෙහිකා ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානී'ති. කිං නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති උදාහු අසන්තං උදාහු මය්හෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං? යංනූනාහං අය්‍යං වීමංසෙය්‍ය'න්ති. අථ ඛො, භික්ඛවෙ, කාළී දාසී දිවා උට්ඨාසි. අථ ඛො, භික්ඛවෙ, වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච - 'හෙ ජෙ කාළී'ති. 'කිං, අය්‍යෙ'ති? 'කිං, ජෙ, දිවා උට්ඨාසී'ති? 'න ඛො අය්‍යෙ, කිඤ්චී'ති. 'නො වත රෙ කිඤ්චි, පාපි දාසි, දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි. අථ ඛො, භික්ඛවෙ, කාළියා දාසියා එතදහොසි - 'සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං, මය්හෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං. යංනූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍ය'න්ති.

02. පාලියට නගන්න.

එසමයෙහි එක්තරා උපාසකයෙකුගේ ප්‍රිය වූ මනාප වූ එකම පුත්‍රයා කලුරිය කෙළේ වෙයි. ඉක්බිති බොහෝ උපාසකයෝ තෙත් වූ වස්ත්‍ර ඇත්තාහු තෙත් වූ හිසකේ ඇත්තාහු මධ්‍යාහ්නයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැන්හි පැමිණියාහු ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියහ. එකත් පසෙක සිටියා වූ ඒ උපාසකයින්ට භාග්‍යවතුන් වහන්සේ "උපාසකයෙනි, තෙපි තෙත් වූ වස්ත්‍ර ඇත්තාහු තෙත් වූ හිසකේ ඇත්තාහු මධ්‍යාහ්නයෙහි මෙහි කුමක් පිණිස පැමිණියහු ද?" යි අසා වදාළ සේක. මෙසේ වදාළ කල්හි ඒ උපාසක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය. "ස්වාමිනී, මාගේ ප්‍රිය වූ මනාප වූ එකම පුත්‍රයෙක් විය. ඔහු කාලක්‍රියා කළේය. එහෙයින් අපි තෙත් වස්ත්‍ර ඇතිව තෙත් හිසකේ ඇතිව මධ්‍යාහ්නයෙහි මෙහි පැමිණියෙමු."

03. සුත්තනිපාතයේ අට්ඨක හා පාරායන වග්ගයන්ට අයත් සූත්‍ර ඉපැරණි ධර්ම කොටස් වශයෙන් සැලකීමේ යුක්තියුක්තතාව පහදන්න.

04. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු ඓතිහාසික මූලාශ්‍රය නයින් පෙන්වා දෙන්න.

05. පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා යුගයට අයත් පාලි සාහිත්‍ය ග්‍රන්ථවලින් එකක් පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

06. පාලි අට්ඨකථා සම්පාදනයෙහි ලා බුද්ධඝෝෂ හිමියන්ගේ දායකත්වය ප්‍රමාණ කරන්න.

07. පාලි වංසකථාවන්හි දක්නට ලැබෙන ආකෘතික ලක්ෂණ තෝරාගත් වංසකථාවක් ආශ්‍රයෙන් විශද කරන්න.

08. පාලි ටීකා සාහිත්‍යයෙහි ස්වර්ණමය යුගය ලෙස පොළොන්නරු යුගය සැලකිය හැකිදැයි විමසන්න.

************************************